සැ. යු.- 2014.08.22 දින පළ වූ අංක 1,877 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,878 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1052 |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1052 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1053 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1051- B 80870— 2,875 (2014/08)
F 1 -

# පළාත් සභා නිවේදන

## නැගෙනහිර පළාත් සභාව

මහනගර සභා ආඥාපනත (වගන්ති 252)

1989 වසරේ අංක 12 දරන, පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ වගන්තිය සමග කියැවෙනු ලබන මහනගර සභා ආඥාපනතේ (වගන්ති 252) කොටස 71(1) මගින් නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා සැලසුම්, පළාත් පාලන, ග්‍රාමීය සංවර්ධන, පුනරුත්ථාපන, නැවත පදිංචිය, මිනිස් බලය, නීතිය හා විනය, ප්‍රාදේශීය පරිපාලනය සහ පරිසර අමාත්‍ය වන අබ්දුල් මජීඩ් මොහොමඩ් නජීබ් වන මාහට පැවරී ඇති බලතල අනුව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කරන ලද කල්මුණ මහනගර සභා බල ප්‍රදේශය තුළ මාර්ගයක නම වෙනස් කිරීමට මෙයින් මා නියෝග කරමි.

අබ්දුල් මජීඩ් මොහොමඩ් නජීබ්,
ප්‍රධාන අමාත්‍යවරයා, මුදල් හා සැලසුම්,
පළාත් පාලන, ග්‍රාමීය සංවර්ධන, පුනරුත්ථාපන,
නැවත පදිංචිය, මිනිස් බලය, නීතිය හා විනය,
ප්‍රාදේශීය පරිපාලනය සහ පරිසර අමාත්‍ය,
නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය.

2014 අගෝස්තු මස 13 වැනි දින.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | - | කල්මුණේ මහනගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | - | අම්පාර |
| 03. | වීදියේ වර්තමාන නම | - | පිච්චිපිලාවඩි වීදිය |
| 04. | අලුතින් යොදා ඇති නම | - | වෛද්‍ය රිස්වි වීදිය |
| 05. | මාර්ග විස්තරය | - | මෙම වීදිය කල්මුණේ මහ නගර සභාවට අයත් කල්මුණ අක්කරපත්තු ප්‍රධාන වීදියෙන් (A4) ආරම්භකර නැගෙනහිර මුහුදු වෙරළ පාරෙන් අවසන් වේ. |

08-1075

# අතුරු ව්‍යවස්ථා

## සම්මත අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි උප වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති *ගැසට් පත්‍රයේ* iv *(ආ)* කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ නගර සභා බල ප්‍රදේශ තුළ සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සියලුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළවම අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සභා රැස්වීම් කරගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සිසිල් බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන, පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බත්කඩ, ආපනශාලා සහ තේ සහ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාහන නතර කිරීම හා වාහන හැසිර වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වෙළඳ පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාර වාර්ථා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා දකුණු පළාතේ, පළාත් සභාව විසින් 2013.07.23 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමකදී ඒකමතිකව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් දර්ශන පාඩිකෝරාල,
ලේකම්,
දකුණු පළාතේ පළාත් සභාවේ
පළාත් පාලන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 30 වැනි දින.

08-1082/1

**සම්මත අතුරු ව්‍යවස්ථාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති ගැසට් පත්‍රයේ iv *(ආ)* කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියලුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සියලුම සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළවම අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සිසිල් බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන් හල් සහ රූපලානව්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, බත්කඩ, ආපනශාලා, සහ තේ හෝ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථා, හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පොදු වෙළඳ පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, වාර වාර්ථා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා දකුණු පළාතේ, පළාත් සභාව විසින් 2013.07.23 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමකදී ඒකමතිකව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් දර්ශන පාඩිකෝරාල,
ලේකම්,
දකුණු පළාතේ පළාත් සභාවේ
පළාත් පාලන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 30 වැනි දින.

08-1082/2

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත/විවෘත) - 2014

මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු තනතුරු :*

 01. උපදේශක III ශ්‍රේණිය (වඩු කර්මාන්ත)
 02. උපදේශක III ශ්‍රේණිය (ලුහු ඉංජිනේරු)
 03. උපදේශක III ශ්‍රේණිය (සම්භාණ්ඩ)
 04. උපදේශක III ශ්‍රේණිය (කෙසෙල් පට්ටා නිෂ්පාදන)

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2014 සැප්තැම්බර් මස 30 වැනි දින වේ.

03. *පොදු කොන්දේසි :*

3.1 අපේක්ෂකයින් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.2 2014 සැප්තැම්බර් 30 දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ පදිංචියක් මධ්‍යම පළාත තුළ තිබිය යුතුය.

3.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු 35 ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැකිය. පුරප්පාඩු සඳහා ඉදිරියේ දී සේවයට බඳවා ගනු ලබන උපරිම වයස 35 නොඉක්මවා තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

04. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :*

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* *සියලු තනතුරු සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| 4.1 වඩු කර්මාන්ත උපදේශක | දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව ගණිතය ඇතුළුව සම්මාන 3 ක් සහිතව අ.පො.ස (සා. පෙළ) විෂයයන් හයකින් සමත්වීම. | කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ එක් අවුරුදු පුහුණු පාඨමාලාව හදාරා සියලු විෂයයන්ගෙන් සමත් වී අවසාන සහතිකය ලබා තිබීම හා එක් අවුරුදු උසස් පාඨමාලාව හාදාරා සමත් වූ බවට අවසාන සහතිකය ලබා තිබීම. |
| 4.2 ලුහු ඉංජිනේරු උපදේශක | ඉහත පරිදි වේ. | කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ එක් අවුරුදු ලුහු ඉංජිනේරු පුහුණු පාඨමාලාව හදාරා සියලු විෂයයන්ගෙන් සමත් වී අවසාන සහතිකය ලබා තිබීම හා උසස් ලුහු ඉංජිනේරු ආයතනයේ එක් අවුරුදු පාඨමාලාව හදාරා සමත් වූ බවට අවසාන සහතිකය ලබා තිබීම. |
| 4.3 හස්ත කර්මාන්ත සම් භාණ්ඩ උපදේශක | ඉහත පරිදි වේ. | සම් භාණ්ඩ වෘත්තියට අදාළව කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ජාතික ශිල්ප සභාව මගින් පවත්වන ලද හය මාසික හෝ ඊට වැඩි පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම. |
| 4.4 කෙසෙල් පට්ටා නිෂ්පාදන උපදේශක | ඉහත පරිදි වේ. | කෙසෙල් පට්ටා වෘත්තියට අදාළව කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ජාතික ශිල්ප සභාව මගින් පවත්වන ලද හය මාසික හෝ ඊට වැඩි පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම. |

(සියලු අධ්‍යාපන සුදුසුකම් 2014 සැප්තැම්බර් මස 30 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.)

05. *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

06. *වැටුප් පරිමාණය :*

6.1 මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා. ප. ච. 06/2006 (iv) අනුව,
රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 (MN1-2006A) වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :* සීමිත/විවෘත

පළාත් රාජ්‍ය සේවා කොමිෂම හෝ පත්වීම් බලධාරියා වෙනුවෙන් ඔහු විසින් බලය පවරනු ලබන පරිදි පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා එයින් ලබන ලකුණුවල ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් අයදුම්කරුවන් අතරින් තෝරා ගැනීම මගින් සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියට බඳවා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලැබීමට නම් සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. එක හා සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති අපේක්ෂකයින් සිටින විට වෘත්තීය හා අධ්‍යාපන සුදුසුකම්වල වඩාත් ඉහළ සුදුසුකම් තිබීම මත ප්‍රමුඛතාවය තීරණය කරනු ලැබේ.

*විෂය නිර්දේශය :*

1. ගණිතය
2. යාන්ත්‍රික ජ්‍යාමිතය
3. සාමාන්‍ය දැනීම
4. මෝස්තර නිර්මාණය

සටහන- මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක තනතුරට බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය වෘත්තියට අදාළව ගණිතය, යාන්ත්‍රික ජ්‍යාමිතිය, සාමාන්‍ය දැනීම හා මෝස්තර නිර්මාණය යන විෂයයන් ආවරණය වන පරිදි ලකුණු 100 ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. කාලය පැය තුනකි.

08. *අයදුම් කිරීමේ ක්‍රමය :*

8.1 විභාග ගාස්තු වශයෙන් රු. 400 ක් මධ්‍යම පළාත් සභා ආදායම් ශීර්ෂ 2003.02.13 ප්‍රධාන ලේකම් (මධ්‍යම පළාත) ට බැරවෙන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ලදුපත, අයදුම්පතට අමුණා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැලකිය යුතු ය.

8.2 මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ -4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2014 සැප්තැම්බර් මස 30 දිනට පෙර "ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය, තැ. පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ

කෙළවරේ "මධ්‍යම පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම - 2014" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.3 අයදුම්කරුවන් අදාල නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම් ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාල කරුණු හෝ එම නිවේදනයේ ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්. එම්. කේ. කේ. කරුණාරත්න,<br>ලේකම්,<br>කර්මාන්ත අමාත්‍යාංශය,<br>මධ්‍යම පළාත.

ආදර්ශ අයදුම්පත

***මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුර සඳහා බඳවා ගැනීම - (සීමිත/විවෘත) 2014***

විභාග අංකය : [ ]<br>(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

අයදුම්පත් නිවේදනයේ 01 අනුව<br>ඉල්ලුම් කරනු ලබන උපදේශක තනතුර : [ ]

01. *(අ)* මුලකුරු සමග නම (සිංහලෙන්) :————.<br>(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

*(ආ)* සම්පූර්ණ නම (සිංහලෙන්) :————.<br>(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. *(අ)* ස්ථිර ලිපිනය සිංහලෙන් :————.<br>(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

*(ආ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

මහනුවර : [ ] මාතලේ : [ ] නුවරඑළිය : [ ]

*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2014................ දිනට මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිය :

අවු. :————. මාස :————. දින :————.

*(ඈ)* දුරකථන අංකය : පෞද්ගලික :————. රාජකාරී :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

04. විභාගයට පෙනී සිටින මාධ්‍ය : (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.

සිංහල : [ ] දෙමළ : [ ] ඉංග්‍රීසි : [ ]

05. උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2014 ——— දිනට වයස :

අවු. :————. මාස :————. දින :————.

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : (අයදුම්පත් කැඳවීම් නිවේදනයේ 04 යටතේ)

අ.පො.ස. (සා. පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

6.2 නිවේදනයේ 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් :

6.2.1 පුහුණු පාඨමාලාවේ නම :————.<br>පුහුණු පාඨමාලාවේ කාලසීමාව :——— සිට ——— දක්වා<br>ආයතනය :————.<br>සහතිකය වලංගු වන දිනය :————.

6.2.2 පළපුරුද්ද පිළිබඳ විස්තර :————.<br>ආයතනය :————.<br>කාල සීමාව :———— සිට :———— දක්වා

07. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත් අංකය :————.<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.<br>දිනය :————.

ලදුපත (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි දාරයක් මෙහි අලවන්න

08. .................................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා

විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ උපදේශක III තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය................................ දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :—————.
අත්සන :—————.
තනතුර හා නිල මුද්‍රාව :—————.

(මෙම සහතිකය රජයේ විදුලහක විදුහල්පතිවරයෙක්/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකුගේ/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060 ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

10. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.-
(අනවශ්‍ය වචන කපා හරින්න)

.......................................................මයා/මිය/මෙනෙවිය දැනට.............................
අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ...................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත් ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් පහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :—————.

08-866

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.